# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,406 - 2024 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2024.10.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස : ඉඩම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක්

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් … … … … | — |
| අවසාන නියෝග … … … … | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් … … | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත … … … … | — |
| මධ්‍යම පළාත … … … … | — |
| දකුණු පළාත … … … … | — |
| උතුරු පළාත … … … … | — |
| නැගෙනහිර පළාත … … … … | — |
| වයඹ පළාත … … … … | — |
| උතුරු මැද පළාත … … … … | — |
| ඌව පළාත … … … … | — |
| සබරගමුව පළාත … … … … | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත …. … … … | — |
| මධ්‍යම පළාත …. … … … | — |
| දකුණු පළාත …. … … … | — |
| උතුරු පළාත …. … … … | — |
| නැගෙනහිර පළාත …. … … … | — |
| වයඹ පළාත …. … … … | — |
| උතුරු මැද පළාත …. … … … | — |
| ඌව පළාත …. … … … | — |
| සබරගමුව පළාත …. … … … | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් …. … … | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් …. … | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් …. … | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම…. … — | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් …. … | 386 |

**සතිපතා නිකුත් වන *ගැසට් පත්‍රයෙහි* පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ඔක්තෝබර් මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

385 - B 82617—553 (2024/10)
C1-

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/74275.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L5/MT/04/ දීර්ඝකාලීන.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 575, කන්නට්ටිය ග්‍රාම නිලධාරි වසමේ කන්නට්ටිය ගමේ අංක 2020/57 අනුරේඛනයේ කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 09 පර්චස් 6.9 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුත්තක් සඳහා දිසානායක මුදියන්සේලාගේ ශ්‍යාමිකා උදයාංගනී දිසානායක මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

| | | |
|---|---|---|
| උතුරට | : | කමල් පියන්තගේ ඉඩම, |
| නැගෙනහිරට | : | අජන්තා කොඩිප්පිලි ආරච්චිගේ හා උපේක්ෂාගේ ඉඩම, |
| දකුණට | : | රජයේ ඉඩම්, |
| බටහිරට | : | ඩබ්. එම්. විජේසූරියගේ ඉඩම. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

අ. බදු කාලය : අවුරුදු තිහ (30) යි. (2024.05.28 සිට 2054.05.27 දක්වා)

ආ. වාර්ෂික බදු මුදල : 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000/-) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ට නොවැඩි විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

ඇ. මෙම ඉඩම **කෘෂිකාර්මික කටයුත්තක්** සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

ඈ. මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

ඉ. පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම යටත් විය යුතුය.

ඊ. සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

උ. ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

ඌ. 2024. 05.28 සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

එ. බදු කුලිය නොකඩඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදුනොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේදී ය.

10 - 92

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.